25.07.2016

ද මැසිනොද් විදුහල - කඳාන

De Mazenod College - Kandana

# දේශපාලන විද්‍යාව - I

Learning Resource Center R De Mazenod College Kandana

පැය 2 යි

2016 අගෝස්තු | 12 - 3rd Term | 12 ශ්‍රේණිය

සැලකිය යුතුයි -

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 1 සිට 50 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4), (5) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු 100 කි

- අංක 01 සිට 13 තෙක් ඇති ප්‍රශ්න සමන්විත වන්නේ ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා අදාළව සපයන ලද ප්‍රකාශ පහකිනි එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න

1) දේශපාලනය යනු

A - දේශපාලන ක්‍රියාකරුවන්ගේ අරමුණු සපුරා ගැනීම වේ

B - දේශපාලන ක්‍රමයක් තුළ ක්‍රියාකරුවන් අතර සිදුවන ක්‍රියාවකි

C - බල අරගලයේ ප්‍රායෝගික ස්වරූපය ලෙස සැලකිය හැකිය

D - පරමාර්ථ හා ක්‍රමවේදයන් අතර නූතන තරඟකාරී තත්ත්වයන් තුළ ද්වන්ද දැකිය හැක

E - එය බලයට ඇති අසීමිත ආශාව උද්දීපනය කරන්නක් වේ

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

2) දේශපාලන විද්‍යාව යනු

A - ග්‍රීක යුගයෙන් ආරම්භ වී අද දක්වා විකාශනය වන පැරණිතම විෂයකි

B - නිශ්චිත වූ සංකල්පයන් සොයා ගැනීමට නොහැකි අධ්‍යයන විෂයකි

C - ශුද්ධ විද්‍යාත්මක විෂයයන් ලෙස පිළිගත් විෂයකි

D - රාජ්‍ය, බලය හා ආණ්ඩුව මූලික තේමාවන් කරගත් විෂයකි

E - සමස්ත සමාජයම පර්යේෂණාගාරයක් ලෙස සලකා කටයුතු කරන විෂයකි

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

3) රාජ්‍යය

A - දණ්ඩනීය බලය ක්‍රියාවට නැංවීම පිළිබඳව ඒකාධිකාරය උරුම කරගෙන සිටියි

B - ස්ථාවර භූමියක පදිංචි ජනතාවගේ එකමුතුවකි

C - කිසිදු බාහිර පාලනයකට යටත් කළ නොහැකිය

D - අනිවාර්ය නොවූ සමාජිකත්වයෙන් ගොඩ නැගී ඇත

E - සමාජිකයාගේ උපත හා විපත පුරණ හිමිකාරීත්වය භාරගනියි

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

4) රාජ්‍යයේ ආරම්භය සම්බන්ධයෙන් අදාළ වන්නේ

A - දේවවරම්වාදය මගින් අයහපත් ආඥාදායක රාජාණ්ඩු වාදී පාලන ක්‍රම බිහිවීම වැළැක්විය හැකි නොවේ

B - සමාජ සම්මුතිවාදය නව යුගය තුළ රාජ්‍ය පිළිබඳ නව මතවාදයක් ලෙස හැඳින්විය හැකිය

C - මිනිසුන් එකට එක් කිරීමෙහිලා සමාජ බන්ධන බලපාන බව විකාශනාත්මකවාදීන් පෙන්වා දෙයි

D - සමාජවාදීන් දක්වන්නේ රාජ්‍ය වූ කාලී මිනිසුන් විසින් තම පොදු යහපත උදෙසා පිහිටුවා ගත් පොදු සංවිධානයක් ලෙසය

E - උත්තරීතර බලයක් සහිත ආඥාදායක රාජ්‍ය ක්‍රමයක් පැසිස්ට්වාදීන්ගේ ආදර්ශය වේ

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

5) රාජ්‍යයක ප්‍රධාන දේශපාලන සංකේත වන්නේ

A - ජාතික කොඩිය
B - රාජ්‍ය මුද්‍රාව
C - ජාතික වීරවරුන්
D - ජාතික ගීය
E - ජාතික අගයන්

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

6) නූතන න්‍යායන්ට අනුව රාජ්‍යවල හැඩගැස්ම කෙරෙහි බලපා ඇති සාධක වන්නේ

A - ත්‍රස්තවාදය
B - ඒකාබද්ධ කිරීම
C - වෙන්වීම
D - ජාතිකවාදය
E - පරිවර්තනය

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

7) මහජනතාව ආණ්ඩුව සමග යා කරන මාර්ග වන්නේ

A - රාජ්‍ය නොවන සංවිධාන
B - සිවිල් සමාජය
C - මැතිවරණ
D - දේශපාලන පක්ෂ
E - ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

8) දේශපාලන හා ආර්ථික මතවාදය අනුව ආණ්ඩුක්‍රම වර්ග කරන ක්‍රම වන්නේ

A - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී
B - කතිපයාධිකාරී
C - නව ලිබරල්වාදී
D - සමාජවාදී
E - සමාජ ප්‍රජාතන්ත්‍රවාදී

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

9) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

A - රටක මූලික නීතිය ලෙස ද සලකයි

B - රාජ්‍ය නායකයා පාලනය ගෙනයා යුත්තේ එයට අනුකූලවය

C - රාජ්‍යයේ මූලික අරමුණු විදහා දක්වන ලියවිල්ල වේ

D - ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම එයට පැවරේ

E - රාජ්‍යය හා ආණ්ඩුව සංවිධානය කිරීමේ මූලධර්මවල එකතුව වේ

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

10) ස්වාධිපත්‍යය

A - රාජ්‍යයේ අත්‍යවශ්‍ය අංග ලක්ෂණයකි
B - බෙදීමට ලක්වුවහොත් විනාශ වී යන බව පවසයි
C - රාජ්‍යයට මෙන්ම අන්‍ය සමාගම්වලටද අයත්වේ
D - බාහිර හා අභ්‍යන්තර වශයෙන් හඳුනාගත හැක
E - වෙනත් ආයතනයකට පැවරිය නොහැකිය

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

25-07-2016
12 - 3rd Term
Political Science

Learning Resource Center
R
De Mazenod College
Kandana

11) නීතිය

A - අණදීම් තහනම් කිරීම් සහ හිමිකම් දැක්වෙන විධිවිධාන පද්ධතියක් වේ

B - ආණ්ඩුව විසින් සාදනු ලබන සමස්ත සමාජය පුරා ක්‍රියාත්මක වන්නක් වේ

C - රාජ්‍යයේ කැමැත්ත ප්‍රකාශ කරන මාධ්‍යය වේ

D - අවනතභාවය ලබා ගන්නේ පොලිස් පහරදීම් වලට මිනිසුන් තුළ ඇති බිය හරහාය

E - පිළිපැදීම අනිවාර්ය වන අතර යටත්වීම තේරීමකට ලක් කිරීමට පුරවැසියන්ට හිමිකම ඇත

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

12) අයිතිවාසිකම්

A - පෞරුෂත්වය වර්ධනය කරගැනීමට අත්‍යවශ්‍ය වේ

B - සිවිල් දේශපාලන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය

C - සංවිධිත සමාජය තුළ පමණක් භුක්ති විඳිය හැකිය

D - යුතුකම්වලින් බැහැරව පවතී

E - සමහර අයිතිවාසිකම් රාජ්‍ය නීති මගින් සුරක්ෂිත කර ඇත

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

13) මහජන මතය

A - ජනතා මනස පාලනය කිරීම සඳහා ආණ්ඩුව යොදා ගන්නා මාධ්‍යයකි

B - ආණ්ඩු බිහිකිරීමට මෙන්ම ඉවත් කිරීමට ද එය බලපායි

C - ජනතා පොදු ගැට පිළිබඳව ආණ්ඩුවට අනතුරු අඟවයි

D - එයට අතීතයක් හෝ අනාගතයක් නැත

E - පැසිස්ට්වාදය තුළ ප්‍රතික්ෂේපිත මාතෘකාවකි

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

- පහත සඳහන් තොරතුරු අදාළ කර ගනිමින් අංක 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A. විවිධත්වය තුළින් ඒකීයත්වය කරා පැමිණීම
B. මට්ටම් දෙකක ආණ්ඩු පැවතීම
C. එක් කේන්ද්‍රයක සියලු බලතල ඒකරාශි වී තිබීම
D. බහුවිධ සමාජවලට වඩා සුදුසු වීම
E. පුරවැසියන් ආණ්ඩු දෙකකට යටත් වීම
F. ස්වාධිපති බලය බෙදී නොතිබීම
G. තනි පරිපාලන සහ අධිකරණ ක්‍රමයක් පැවතීම
H. බලය කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවිය හැකිවීම

14) සන්ධීය ක්‍රමයට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න

1. ABCE 2. ACDE 3. BDFG 4. CFGE 5. EFGH

15) ඒකීය ක්‍රමයට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න

1. ABCD 2. ACDE 3. CFGH 4. ADCF 5. CFGE

- අංක 16 සිට 21 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළව ප්‍රකාශ පහක් දක්වා ඇත ඒවායින් එක් ප්‍රකාශයක් සාවද්‍ය වේ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

16) කැබිනට් ආණ්ඩුක්‍රමය
1. ආඥාදායක ආණ්ඩු ක්‍රමයක් ලෙස අර්ථකථනය කරයි
2. ද්වි සභාග ආණ්ඩු බිහිවීමට බලපායි
3. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය ව්‍යුත්පන්න වේ
4. වඩාත් ප්‍රජාතන්ත්‍රීය වුව ද කාර්යක්ෂමතාවයකින් අඩු ආණ්ඩු ක්‍රමයකි
5. දේශපාලන විධායකය නාමික හා සත්‍ය වශයෙන් කොටස් දෙකකට බෙදෙයි

17) විධායකය
1. නීති ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන ආයතන ලෙස ක්‍රියා කරයි
2. සිය කටයුතු ස්ථිර විධායකය යොදා ගනිමින් සිදු කරයි
3. කිසිදු වගකීමකට බැඳී නොසිටියි
4. පාර්ලිමේන්තු, ජනාධිපති, ආඥාදායක වශයෙන් ත්‍රිවිධාකාර වේ
5. විශ්වාසභංග යෝජනාවකින් හෝ දෝෂාභියෝගී චෝදනාවක් සම්මත කිරීමෙන් ප්‍රජාතන්ත්‍රවාදීව ඉවත් කළ හැක

18) ඒකීය ආණ්ඩු ක්‍රමය
1. ත්‍රිවිධ බලතල මධ්‍යම ආණ්ඩුව සතු වේ
2. මධ්‍යම ආණ්ඩුවේ කැමැත්ත මත ප්‍රාදේශීය ආයතනවලට බලය විමධ්‍යගත කර ඇත
3. ඒකීය පරිපාලන රටාවක් හා ඒකීය අධිකරණ රටාවක් දක්නට ඇත
4. විශාල භූමි ප්‍රදේශයක් පාලනය කිරීම සඳහා වඩාත් උචිතම ක්‍රමයක් වීම
5. මධ්‍යම ආණ්ඩුව හා පළාත් පාලන ආයතනය අතර ගැටුම් හට ගැනීමට ඉඩකඩ නොමැත

19) සභ සන්ධීය ආණ්ඩුක්‍රමය
1. ඕනෑම ප්‍රාන්ත රාජ්‍යයකට ස්වාධීන වීමට හැකියාව ඇත
2. ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් හා දුර්වල ප්‍රාන්ත ආණ්ඩු දැකිය හැකිය
3. ඒකීය හා සන්ධීය ක්‍රමයේ අතර මැදි තත්ත්වයක් නිසා ජාත්‍යන්තර සම්බන්ධතාවල දී ඒකමතිකතාවයක් ඇති කර ගැනීමට අපහසු වේ
4. ජීවමාන හා ශක්තිමත් විධායකයකු සහිත මධ්‍යම ආණ්ඩුවක් නිර්මාණය කිරීමට හැකියාවක් නොමැත
5. සභ සන්ධීය රාජ්‍යයන්ට තරමක උදාහරණයක් සැපයිය හැක්කේ නූතන ජර්මන් ෆෙඩරල් එකමුතුවයි

20) බලපෑම් කණ්ඩායම් හා දේශපාලන පක්ෂ අතර වෙනසක්කම්
1. දේශපාලන පක්ෂයකට ආර්ථික දේශපාලන සාමාජීය වැඩපිළිවෙළක් තිබුණද බලපෑම් කණ්ඩායම් පුළුල් බහුජන සංවිධානයක් නොවේ
2. දේශපාලන පක්ෂ ජාතික මට්ටමටමෙන් සංවිධානය වුවද බලපෑම් කණ්ඩායම් පටු සංවිධාන ව්‍යුහයකින් යුක්ත වේ
3. බලපෑම් කණ්ඩායම්වල ස්වභාවය දේශපාලන බලය දිනා ගැනීම වුවද දේශපාලන පක්ෂවල අරමුණ ආණ්ඩුවට විරුද්ධව කුමන්ත්‍රණය කිරීම වේ
4. බලපෑම් කණ්ඩායම් ප්‍රතිපත්ති සම්පාදකයින්ට බලපෑම් කරනු ලබයි
5. දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති සමස්ත සමාජය උදෙසාම වුවද බලපෑම් කණ්ඩායම්වල එවැනි අරමුණක් නැත

21) ජනමත විචාරණය
1. යෝජිත නීතියකට මහජනයාගේ තීන්දුව ඉල්ලයි
2. නීති සම්පාදනයට සෘජුව මහජනයා හවුල් කර ගනියි
3. නීති සම්පාදනයට ඇති ඉතාමත් ප්‍රායෝගික ක්‍රමය වේ

4. එය නීති සම්පාදනයේ මූලයට සංවරණයකි
5. ස්විස්ටර්ලන්තයේ සෑම ව්‍යවස්ථා සංශෝධනයක්ම ජනමත විචාරණයට ඉදිරිපත් කළ යුතුය

- අංක 22 සිට 25 දක්වා ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා සම්බන්ධ ප්‍රකාශ පහක් දක්වා ඇත එම ප්‍රකාශ අතුරෙන් හතරක් සාවද්‍ය වේ සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තෝරන්න

22) සංවර්ධනය වෙමින් පවත්නා රටවල රාජ්‍ය පරිපාලනයේ ස්වභාවය
A - රාජ්‍ය පරිපාලන යන්ත්‍රණය ආයතනිකගතව ම ප්‍රබලව පැවතීම
B - ප්‍රමාණය ඉක්මවා නොගිය රාජ්‍ය සේවක පිරිසක් නඩත්තු කිරීම ආණ්ඩුවට පහසු කාර්යයක් වීම
C - පරිපාලකයින් හා සාමාන්‍ය ජනතාව අතර පවත්නා පරතරය සුහදශීලී වාතාවරණයක් ගැනීම
D - ජාතික මට්ටමින් ගොඩනැගුණු මූලධර්ම සහිත පරිපාලන නිලධාරීන් පංතියක් හෝ ආයතනික රටාවක් නොවීම
E - රාජ්‍ය පරිපාලනය රටේ සංවර්ධනයට වඩාත් අභිමුඛ වූ අරමුණු සාධනය සඳහා යොදාගෙන තිබීම

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

23) පුද්ගලයින් හා පුද්ගලයින් අතර ගැටුම්වලට හේතු
A - උගත්කම
B - බුද්ධිමත් බව
C - යහපත් සමාජයානුයෝජනය
D - පරාර්ථකාමිත්වය
E - ආක්‍රමණශීලී බව

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

24) ජාත්‍යන්තර නීතිය ආරක්ෂා කිරීමේ දී ජාතික රාජ්‍යයන් වෙත පැවරෙන වගකීම්
A - එක්සත් ජාතීන්ගේ කටයුතු හමුවේ අවනත නොවී සිටීම
B - අසල්වැසි රාජ්‍යයන්වල අභ්‍යන්තර ප්‍රශ්න සඳහා මැදිහත් වීම
C - ආයුධ නිෂ්පාදනයල අත්හදා බැලීම හා වෙළදාම සාධාරණිකරණය කිරීම
D - ජාත්‍යන්තර අධිකරණය මගින් කරුනු ලබන නියෝගවලට හා එහි තීන්දුවලට අවනත වීම
E - එක්සත් ජාතීන්ගේ පරීක්ෂණ හා නිරීක්ෂණ කටයුතු සඳහා අදාල කණ්ඩායම් තම රාජ්‍යයන්ට ඇතුළත් වීම ප්‍රතික්ෂේප කිරීම

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

25) නිර්දිෂ්ට රටවල්වල දේශපාලන ක්‍රමයන් හි විශේෂ ලක්ෂණ කිහිපයක්
A - මහා බ්‍රිතාන්‍යයේ ප්‍රබලම මණ්ඩලය සාමි මන්ත්‍රී මණ්ඩලය වන අතර අගමැති ඇතු කැබිනට් මණ්ඩලය තෝරා ගනු ලබන්නේ එම මණ්ඩලය තුළිනි
B - ඇමරිකානු ආණ්ඩු ක්‍රමය පාර්ලිමේන්තු විධායක ජනාධිපති ක්‍රමයක් වන අතර ඇමරිකානු ජනාධිපතිවරයා ඔහුගේ කැබිනට් මණ්ඩලය එරට කොන්ග්‍රස් මණ්ඩලය තුළින් තෝරා ගනු ලබයි
C - ඉන්දියාව අර්ධ සන්ධීය රාජ්‍යයක් ලෙස නම් කරන අතර ද්විත්ව ව්‍යවස්ථාදායකයක් හා ද්විත්ව විධායකයක් දක්නට ලැබේ
D - ප්‍රංශ අග්‍රාමාත්‍යවරයා රාජ්‍යයේ ආණ්ඩුවේ හා විධායකයේ නායකයාවන අතර සන්නද්ධ සේවාවන්හි ප්‍රධාන අණදෙන නිලධාරියා ද වේ
E - ස්විට්සර්ලන්ත ආණ්ඩු ක්‍රමය සන්ධීය නම්‍ය අලිඛිත වන අතර සාමූහික විධායකය තුළින් ජනාධිපතිවරයා ඇතු කැබිනට් මණ්ඩලය තෝරා ගනු ලබයි

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

● අංක 26 සිට 37 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි <u>නිවැරදි ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න</u>

26) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ සංස්කෘතිය බිඳ දැමීමට ගත් පියවර

A - ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කරමින් ස්වදේශික බටහිර ගැති පංතියක් නිර්මාණය කිරීම

B - ආගම ව්‍යාප්ත කිරීම සඳහා සෙමනේරි බිහි කිරීම

C - ස්වයංපෝෂිත කෘෂිකර්මය බිඳ දමමින් වාණිජ බෝග වගාවට අවශ්‍ය ශ්‍රමිකයන් නිර්මාණය කිරීම

D - සාමූහිකත්වය බිඳ දමමින් අධිරාජ්‍යයට එරෙහිව දේශීය ජනතාවගේ සංවිධානාත්මක භාවය බිඳ දැමීම

E - මෙරට ග්‍රාමීය ජනතාවගේ සාම්ප්‍රදායික වගා භූමි ආරක්ෂා කිරීමට නීති පැනවීම

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

27) 1833 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ දේශපාලන ආර්ථික හා සමාජ ප්‍රතිඵල

A - ප්‍රාදේශීය රදළ නායකයිනගේ අධිසමාජීය බලය නැතිවීම

B - නිදහස් ස්වාධීන සිවිල් සේවාවක් වර්ධනය වීමේ පදනම වැටීම

C - වෙළඳපොල ආර්ථිකයක් වර්ධනය වීම සඳහා පදනම වැටීම

D - අධිරාජ්‍ය වාදයේ වර්ධනයත් සමග කුල වාදය වර්ධනය වීම

E - ආයාත නිර්යාත ආර්ථික ක්‍රමයක් ආරම්භයට පදනම වැටීම

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

28) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

A - වාර්ගික නියෝජනය අහෝසි කළේය

B - ලාංකිකයින්ට 7/10 ක විධායක බලතල පැවරිය

C - රාජකාරී ක්‍රමය යලි හඳුන්වා දීම

D - මධ්‍යම පංතියේ දේශපාලනයට සාමාන්‍ය ජනතාව බද්ධ කිරීම

E - තරගකාරී ආර්ථිකයට දේශපාලන තරගය ඇතුළත් කිරීම

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

29) ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකරුට නිශේධ බලය යෙදිය හැකි පණත් වූයේ

A - රාජ්‍ය සේවය හා සම්බන්ධ පණත්

B - අභ්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ පණත්

C - රාජ්‍ය ආරක්ෂාවට බලපාන පණත්

D - රටේ මූල්‍ය තත්ත්වයට බලපාන පණත්

E - අධිකරණය සම්බන්ධ පණත්

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

30) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභාව

A - රටේ සමස්ථ මුදල් පාලන බලතල හිමිව ඇත

B - සුලු ජාතින් වෙනුවෙන් 8 දෙනෙකු ආණ්ඩුකාරයා පත් කිරීම

C - සභානායක වනුයේ ආමාත්‍ය මණ්ඩලයේ උපසභාපතිවරයාය

D - ආරක්ෂක හා විදේශ කටයුතු සම්බන්ධයෙන් නීති සම්පාදනය කළ නොහැක

E - මුලසුන දරනුයේ ආණ්ඩුකාරවරයාය

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

31) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අංග ලක්ෂණවලට අදාළ වන්නේ

A - ද්වී මණ්ඩලීය ව්‍යවස්ථාදායකය

B - නාමික ජනාධිපතිධූරය

C - ද්විත්ව විධායකය

D - සුලු ජාතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

E - අධිකරණ සේවය ස්වාධීන කිරීම

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

32) සෝල්බරි ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකය

A - ද්වි මාණ්ඩලික විය

B - නාමකරණයෙන් හා ජනතා ඡන්දයෙන් නියෝජිතයන් පත්විම

C - ව්‍යවස්ථා සම්පාදන බලය සීමා විම

D - පාර්ලිමේන්තුව යන නිල නාමයෙන් හැඳින්විම

E - මණ්ඩල දෙකේ නිල කාලය සමාන විම

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

33) සුළු ජන කොටස් සඳහා සෝල්බරි ව්‍යවස්ථාව තුළ අන්තර්ගත ආරක්ෂණය වූයේ

A - 1947 ව්‍යවස්ථාවේ 29 වන වගන්තිය

B - ඔම්බුඩ්ස්මන්වරයා

C - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

D - සෙනෙට් සභාව

E - බහු මන්ත්‍රී ආසන

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

34) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව

A - රටේ සමස්ත මුදල් පාලන බලතල හිමිව ඇත

B - මහජන නියෝජිතයින්ගෙන් පමණක් සමන්විත විය

C - උත්තරීතර ආයතනයක් විය

D - ස්වාධිපති බලය ක්‍රියාත්මක නොවිය

E - මුලසුන දරනුයේ කථානායකවරයාය

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

35) 1972 ව්‍යවස්ථාව යටතේ අගමැතිවරයා

A - ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයෙකු වේ

B - කැබිනට් මණ්ඩලයේ මුලසුන දරයි

C - ජනාධිපති විසින් පත් කරනු ලැබේ

D - විශ්වාසභංග යෝජනාවක් මගින් ඉවත් කළ නොහැකිය

E - අමාත්‍යවරුන්ගේ විෂය පරිපථය තීරණය කරනු ලැබේ

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

6) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

A - ජනාධිපති පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කළේය

B - විධායකයේ නායකයා ව්‍යවස්ථාදායකය තුළින් ගොඩ නැගිය

C - ශ්‍රේෂ්ඨාධිකරණය ඉහළ උසාවිය වන පරිදි අධිකරණ ව්‍යුහය සකස් කළේය

D - ආණ්ඩුව මෙහෙයවීම හා පාලනය භාරව කැබිනට් මණ්ඩලයක් විය

E - සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දෙන ලදී

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

37) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව

A - ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ක් දක්වා සීමා විම

B - ජනාධිපතිධුරයට පත් විම දෙවරක් දක්වා සීමා විම

C - අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 30 දක්වා සීමා විම

D - ජනාධිපතිවරයාට නිල කරුණු සම්බන්ධයෙන් අධිකරණයට කැඳවීමේ හැකියාව ලැබී තිබීම

E - ඕනෑම අවස්ථාවක ජනාධිපතිවරයාට අගමැතිවරයාව තනතුරෙන් ඉවත් කළ හැකි විම

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

- පහත දක්වා ඇත්තේ 1947 සහ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ වන ප්‍රකාශ කිහිපයකි ඒවා ඇසුරෙන් අංක 38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A – වසර 5 ක නිල කාලයක් හිමි බව සාමාන්‍යයෙන් පිළිගැනුණි.
B – බ්‍රිතාන්‍ය රාජාණ්ඩුව නියෝජනය කරන ලදී
C – බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම සම්ප්‍රදායන් අනුගමනය කළ යුතු විය
D – ව්‍යවස්ථාදායකය උත්තරීතර ආයතනය විය
E – වරදකරුවන්ට සමාව දීම නාමික විධායකය විසින් සිදු කරයි
F – ව්‍යවස්ථාදායකයක ඒක මණ්ඩල විය
G – රාජ්‍ය මූල්‍ය පාලන බලතල ව්‍යවස්ථාදායකයට හිමි විය
H – නාමික විධායකය වාර්ෂික රාජාසන කථාව ඉදිරිපත් කරන ලදී
I – නීති විවරණය කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි වෙයි
J – කැබිනට් ආණ්ඩුක්‍රම ආකෘතියක් ක්‍රියාත්මක විය

38) 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අග්‍රාණ්ඩුකාරවරයා
1. BCDE  2. BCEH  3. ABCE  4. ACEI  5. BCGI

39) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාය යටතේ දක්නට ලැබෙන පොදු ලක්ෂණ
1. ABCD  2. ABEJ  3. EGHJ  4. ACEH  5. CEGJ

- අංක 40 සිට 44 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාලව ප්‍රකාශ පහක් දක්වා ඇත ඒවායින් එක් ප්‍රකාශයක් සාවද්‍ය වේ සාවද්‍ය ප්‍රකාශ තෝරන්න

40) 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණවලට අදාළ විධායක සභාව
1. සමන්විත වුයේ සාමාජිකයන් හයදෙනෙකුගෙනි
2. සියලුම සාමාජිකයන් නිලබලයෙන් පත්විය
3. ආණ්ඩුකරුගෙ නායකත්වයෙන් රැස්විය
4. ආණ්ඩුකරුට සහායවීමේ උපදේශක සභාවක් විය
5. විසුරුවා හැරීමේ බලය ආණ්ඩුකරු සතුවිය

41) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ අංග ලක්ෂණ කිහිපයක් වන්නේ
1. සර්වජන ඡන්ද බලය
2. ලාංකිකයන් හා රාජ්‍ය නිලධාරීන්ගෙන් නිර්මිත අමාත්‍ය මණ්ඩලය
3. රාජ්‍ය සේවය මුදල් හා විදේශ කටයුතු පිළිබඳ විධායක බලතල ලාංකිකයන්ට හිමි වීම
4. ආණ්ඩුකරුගේ නාමකරණයෙන් නියෝජිතයින් 8 දෙනෙකු රාජ්‍ය මන්ත්‍රණ සභාවට තෝරා පත්කර ගැනීම
5. ආණ්ඩුක්‍රමය ද්විත්ව විධායකය මත පදනම් වීම

42) පළමු ජනරජ ව්‍යවස්ථාව
1. නිදහසින් පසු පිහිටුවන ලද ප්‍රථම දේශිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විය
2. ශ්‍රී ලංකාව නිදහස් ස්වාධීන ස්වෛරී ඒකීය ජනරජයක් විය
3. කැබිනට් ආණ්ඩුක්‍රමය තවදුරටත් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී
4. පාර්ලිමේන්තු ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කරන ලදී
5. ආණ්ඩුක්‍රම යාන්ත්‍රණය බලතල බෙදීමේ මූලධර්ම මත ගොඩනගන ලදී

25.07.2016

12 - 3rd Term
Political Science.

Learning Resource Center
R
De Mazenod College
Kandana

43) පළමුවන ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා
1. ඡන්ද බලය හිමි කවර හෝ පුරවැසියෙකු අග්‍රාමාත්‍යවරයා විසින් පත්කළ හැක
2. ඉවත් කළ හැක්කේ විශ්වාසභංග යෝජනාවක් ජාතික රාජ්‍ය සභාවෙන් අනුමත කිරීමෙනි
3. ඔහු ජනරජයේ ප්‍රධානියා ලෙස කටයුතු කළේය
4. ඔහුගේ ධුරකාලට සීමාවක් නොමැත
5. ඔහු අගමැතිගේ හා අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය

44) දෙවන ජනරජ ව්‍යවස්ථාව අනුව විධායක ජනාධිපති ධුරයේ අයහපත
1. ජනාධිපතිධුරය පුරප්පාඩු වූ විට පාර්ලිමේන්තු සාමාජිකයෙකු ඇසුරෙන් අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා ගැනීම
2. ජනාධිපතිවරයා ඉවත් කිරීමේ ක්‍රමවේදය ඉතා සරල වීම
3. ජනාධිපතිවරයාගේ බලය මත පාර්ලිමේන්තුව අවතක්සේරු වීම
4. ජනාධිපතිවරයා වටා ආණ්ඩුවේ ත්‍රිවිධ බලතල මධ්‍යගත වීම
5. ආඥාදායක පාලනයක් ගෙනයාමට ජනාධිපතිවරයාට හාකියාව ලැබීම

- අංක 45 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත්කොට ඇත ඒවායින් ප්‍රකාශ හතරක් වැරදි වේ වැරදි ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න

45) රාජකාරි ක්‍රමය අහෝසි කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වූයේ

A - කෝල්බෲක් - කැමරන්  B - මැනිං  C - මැනිං ඩෙවොන්ෂයර්
D - ඩොනමෝර්  E - සෝල්බරි

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

46) ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයින් තෝරාපත් කරගැනීමට ප්‍රථමවරට ඡන්දබලය හඳුන්වා දුන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වූයේ

A - 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය  B - 1911 ක්‍රෑව් මැකලම් ප්‍රතිසංස්කරණය
C - 1924 මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය  D - 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය
E - 1948 සෝල්බරි ප්‍රතිසංස්කරණය

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

47) ඩොනමෝර් විධායක කාරක සභා

A - රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයින් සියලු දෙනා විධායක කාරක සභා 7 කට බෙදන ලදි
B - දේශපාලන ලක්ෂ ක්‍රමයක් තිබීම තුළ විධායක කාරක සභා ඇති කරන ලදි
C - රාජ්‍යයේ වැදගත්ම පාලන අංශ 7 ලාංකිකයන්ට පවරා දුනි
D - ආණ්ඩු පක්ෂයක් හා විපක්ෂයක් දක්නට ලැබිණි
E - අනාගත කැබිනට් ක්‍රමයක් නිර්මාණය කිරීමට ගත් උත්සහයකි

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

48) ඩොනමෝර් ව්‍යවස්ථාවට අනුව අමාත්‍ය මණ්ඩලය රාජ්‍ය මන්ත්‍රණ සභාවට සාමූහිකව වගකිව යුතු වූයේ

A - යුද්ධ කටයුතු සඳහා කෙරෙන වියදම් වෙනුවෙන් පමණි
B - වාර්ෂික අයවැය ලේඛනය වෙනුවෙන් පමණි
C - අමාත්‍ය මණ්ඩලය ගන්නා සියලුම විධායක තීරණ වෙනුවෙනි
D - ආණ්ඩුකාරයා හා රාජ්‍ය නිලධාරීන් තිදෙනා හා සම්බන්ධ වියදම් වෙනුවෙන් පමණි
E - අමාත්‍ය මණ්ඩලය නඩත්තු කිරීම සඳහා වැය වන වියදම් වෙනුවෙන් පමණි

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

49) 1972 ව්‍යවස්ථාදායකය

A - සියලු බලතල විමධ්‍යගත කළ ආයතනයකි

B - රාජ්‍ය සභාව ලෙස නම් කෙරිණි

C - ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායකයක් ලෙස හඳුන්වන ලදි

D - එයට උත්තරීතර බලයක් හිමි නොවිය

E - එයට මන්ත්‍රීවරුන් තෝරාගනු ලැබුවේ සමානුපාතික නියෝජන ක්‍රමය තුළිනි

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

50) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ

A - බහු පක්ෂ ක්‍රමයකි

B - කේවල පක්ෂවලින් පමණක් සමන්විත ක්‍රමයකි

C - ඒක පක්ෂ ක්‍රමයකි

D - ද්විපක්ෂ ක්‍රමයකි

E - ඒක පක්ෂ නායකත්වයක් සහිත බහු පක්ෂ ක්‍රමයකි

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

Learning Resource Centre
K
De Mazenod College
Kandana

ද මැසිනොද් විදුහල - කඳාන

# De Mazenod College - Kandana

# දේශපාලන විද්‍යාව - II

25.07.2016

පැය 3 යි

2016 අගෝස්තු

12 ශ්‍රේණිය

12 - 3rd Term

සැලකිය යුතුයි -

- මෙම පිළිතුරු පත්‍රය A, B, C වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ
- A කොටසෙහි සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුයි
- B හා C කොටස් සඳහා පිළිතුරු සැපයීමට වෙනම පිළිතුරු ලියන කඩදාසි සපයාගත යුතුය
- පිළිතුරු සපයා අවසානයේදි A කොටස B හා C කොටස් වල පිළිතුරු සමග අමුණා භාරදිය යුතුය

## A කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය
- A කොටසට නියමිත ලකුණු ප්‍රමාණය 20 කි

1. දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස සැලකේ මෙම ප්‍රකාශය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති තර්ක දෙකක් නම් කරන්න

.........................................................................................................................................

.........................................................................................................................................

2. මිනිසාගේ දේශපාලන හැසිරීම කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කරන්න

.........................................................................................................................................

.........................................................................................................................................

3. මිනිසුන්ට විධිමත් දේශපාලනික දැනුමක් ලබාදීමට පාසල යොදාගන්නා උපක්‍රම 2 ක් දක්වන්න

.........................................................................................................................................

.........................................................................................................................................

4. ලිබරල් ප්‍රජාත්නත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් පදනම් වී ඇති ආර්ථික මූලධර්මවල ලක්ෂණ දෙකක් දක්වන්න

.........................................................................................................................................

.........................................................................................................................................

5. නව රාජ්‍යයක ලක්ෂණ දෙකක් දක්වන්න

.........................................................................................................................................

.........................................................................................................................................

6. ආණ්ඩුවේ බාහිර කාර්යයන් 2 ක් දක්වන්න

.........................................................................................................................................

.........................................................................................................................................

7. ජනාධිපති ආණ්ඩුක්‍රමයක අවාසි 2 ක් දක්වන්න

.........................................................................................................................................

.........................................................................................................................................

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යයන් 2 ක් දක්වන්න

.........................................................................................................................................

.........................................................................................................................................

9. පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය සඳහා අවශ්‍ය මූලික සාධක 2 ක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

10. අධිකරණ ස්වාධීනත්වය සඳහා අවශ්‍යය මූලික සාධක 2 ක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

11. දුබල දේශපාලන සමාජානුයෝජනයට ලක්වූවෙකු සතු ලක්ෂණ 2 ක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

12. ජනමත විචාරණයේ වාසි 2 ක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

13. 1931 විධායක කාරක සභාවක් සතු බලතල 2 ක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

14. 1947 සොල්බරි ව්‍යවස්ථාව යටතේ සෙනෙට් මණ්ඩලය පිහිටුවීමේ අරමුණු 2 ක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

15. 1921 දී ජාතික සංගමය බෙදීමෙන් ඇති වූ ප්‍රතිඵල 2 ක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

16. ලංකා ජාතික සංගමයේ අරමුණු 2 ක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

17. 1931 පණත් කෙටුම්පත් සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයාට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග 2 ක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

18. 1972 ව්‍යවස්ථාව යටතේ පහත තනතුරු දැරුවේ කවුරුන්ද?

i. ආණ්ඩුවේ නායකයා ................................................................................................

ii. විධායකයේ නායකයා ..............................................................................................

19. 1972 නව ව්‍යවස්ථාවක් පැනවීමට පක්ෂව ඉදිරිපත් වූ තර්ක දෙකක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

20. 1972 ව්‍යවස්ථාවේ නවාංග දෙකක් දක්වන්න

................................................................................................................................................

................................................................................................................................................

( ලකුණු 20 x 1 = 20 )

25.07.2016

ද මැසිනොඩ් විදුහල - කඳාන

# De Mazenod College - Kandana

# දේශපාලන විද්‍යාව - II

පැය 3 යි

2016 අගෝස්තු

12 ශ්‍රේණිය

සැලකිය යුතුයි -

- B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න
- එක් පිළිතුරකට හිමි ලකුණු සංඛ්‍යාව 20 කි මුලු ලකුණු 80 කි

## B කොටස

1) දේශපාලන විද්‍යාව ගතික විෂයක් වේ එහි විෂය ක්ෂේත්‍රය දෛනිකව වෙනස් වේ ඔබ එකගවන්නේද? විග්‍රහ කරන්න

( ලකුණු 20 )

2) පහත දැක්වෙන ඒවායින් කරුණු 2 ක් පමණක් සන්සන්දනාත්මකව විග්‍රහ කරන්න
   1. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු හා පැසිස්ට්වාදී ආණ්ඩු වල ලක්ෂණ
   2. ජනාධිපති ආණ්ඩුක්‍රම හා කැබිනට් ආණ්ඩුවල වාසි අවාසි
   3. ඒකීය ආණ්ඩුක්‍රමයක හා සන්ධීය ආණ්ඩුක්‍රමයක වාසි අවාසි
   4. ජනමත විචාරණයේ වාසි අවාසි
   5. ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාර්ගයක් ලෙස ව්‍යවස්ථානුකූලවාදයේ හා බලතල බෙදීමේ වාසි

( ලකුණු 10 x 2 = 20 )

3)
   1. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුල හා
   2. පැසිස්ට් රාජ්‍යයක් තුල පුද්ගලයාගේ තත්ත්වය විමසන්න ( ලකුණු 10 x 2 = 20 )

4) පහත දැක්වෙන ඕනෑම ඒවායින් දෙකක් පිළිබඳව සාකච්ඡා කරන්න
   1. සරල බහුතර මැතිවරණ ක්‍රමයේ හා සමානුපාතික මැතිවරණ ක්‍රමයේ වාසි අවාසි
   2. බලපෑම් කණ්ඩායම්වල කාර්යභාරය
   3. දේශපාලන සමාජානුයෝජන කාරක
   4. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සිවිල් සමාජයේ කාර්යභාරය
   5. දේශපාලන සංස්කෘතිය හා එහි මට්ටම් (පහල, මැදි, ඉහළ)

( ලකුණු 10 x 2 = 20 )

## C කොටස

5) පහත සඳහන් කරුණු අතරින් ඒකක් ගැන පමණක් සාකච්ඡා කරන්න
   1. 1833 සිට 1921 දක්වා ව්‍යවස්ථාදායකය තුල සිදු වූ නියෝජනය
   2. නිදහස් ව්‍යාපාරය තුල ජාතික සංගමයේ භූමිකාව
   3. නිදහසට පෙර හා පසු වාමාංශික ව්‍යාපාරයේ බිඳවැටීමට බලපෑ මූලික සාධක
   4. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ වාසි අවාසි ( ලකුණු 20 )

6) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ඇශ්‍රයෙන් පහත කරුණු දෙකක් ගැන පමණක් සාකච්ඡා කරන්න

1. එක්කෝ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වාදීම කෙරෙහි බලපෑ සාධක නැතනම් සර්ව ජන ඡන්ද බලයේ වාසි අවාසි
2. විධායක කාරක සභා ක්‍රමයේ වාසි අවාසි
3. ආණ්ඩුකාරවරයාගේ භූමිකාව
4. අමාත්‍ය මණ්ඩලය
5. රාජ්‍ය නිලධාරින් හා ඔවුන්ගේ භූමිකාව

( ලකුණු 10 x 2 = 20 )

7) සොල්බරි ආණ්ඩුක්‍රමය ආශ්‍රයෙන් පහත කරුණු දෙකක් ගැන පමණක් විමසන්න

1. නාමික විධායකය හා එහි කාර්යභාරය
2. සුළු ජාතික රැකවරණය සඳහා ගෙන තිබූ ක්‍රියාමාර්ග
3. ව්‍යවස්ථායකයේ ස්වාධිපත්‍යය බලය
4. සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබූ දුර්වලතා

( ලකුණු 10 x 2 = 20 )

8) 1948 සොල්බාරි ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ හා 1972 ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ සංසන්දනාත්මකව විමසන්න

( ලකුණු 20 )